**2026-02-26 බළන්ගොඩ ප්‍රාදේශිය සභා**
**විශේෂ මහා සභා රැස්වීමේ**
**සංක්ෂිප්ත වාර්තාව**

2026 පෙබරවාරි මස 26 වන දින පෙ.ව.10.00ට බළන්ගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.

**සහභාගිත්වය :**

1. ගරු සභාපති - ගමඇතිගේ ආරියදාස මැතිතුමා
2. ගරු උපසභාපති - බී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.බී.ගුණරත්න මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.රෝහණ ජගත් වීරසේකර මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.යූ.සී.තිලක් වික්‍රමසිංහ මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - යූ.ඉන්දික කරුණාරත්න මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.නන්දසිරි මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි.සමන් කුමාර මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.පී.එම්.සනත් ධර්මරාජ මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.එම්.ඩබ්.ලක්රුවනි සමරනායක මැතිනිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.ඩී.ඩී.ජයශීලි ලියනගේ මැතිනිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.කේ.අජිත් ප්‍රියන්ත මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බී.එන්.දීපශිකා පෙරේරා මැතිනිය
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එම්.ආර්.නයනජිත් හේමාල් මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි.එල්.පී.කුමාර ගුණසිරි මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.කේ.ඩබ්.ජගත් නිලන්ත කුමාර මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එම්.ශ්‍රියානි මැතිනිය
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.කේ.ඩී.රෝෂන් ක්‍රිස්ටි මැතිතුමා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.අසෝක්කුමාර් මැතිතුමා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඩී.ඉඳුනිල් ප්‍රියන්ත මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඩබ්.අනුර ක්‍රිෂාන්ත් බස්නායක මැතිතුමා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ටී.කුසුම්සිරි අලංකාර මැතිතුමා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.කේ.දහම් ගුණසේකර මැතිතුමා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.සී.ඉන්ද්‍රානි ගුණසිංහ මැතිනිය
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.පී.නිලන්ති වීරවංශ මැතිනිය

**සහභාගි නොවූ :-**

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.ඩබ්.තුෂාර කුමාර මැතිතුමා
02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.නිශාන්ත කිත්සිරි මැතිතුමා
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - මුදිත ප්‍රසාද් මල්ලිකාරත්න මැතිතුමා
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ඩබ්.දර්මදාස මැතිතුමා
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමි
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.එම්.වජිරා ගීතානි වීරසේන මැතිනිය
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.ඩබ්.පී.චන්ද්‍රාණි නන්දරත්න මැතිනිය
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.එන්.විමලසේන දිසානායක මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - යූ.රෝහණ පුෂ්පකුමාර මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ජී.දනුෂ්ක සමන්ත කුමාර මැතිතුමා

**01.2025 වර්ෂයට අදාළ අවසන් ගිණුම් වාර්තාව සඳහා අනුමැතිය ලබා ගැනීම**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.එම්.සනත් ධර්මරාජ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

අපි මේ මූල්‍ය ප්‍රකාශනේ ඊයේ රෑ තමයි හදලා අවසන් කරන්නේ. ඒ තරම්ම සැළකිය යුතු රාජකාරියක් තියෙනවා මෙකේ. ඒ නිසා අපි මේක දැන් සම්මත කර ගන්න ඕන. ඒක සම්මත කර ගන්න අපිට මෙහෙම පුළුවන් කමක් තියෙනවා. සභාව කාරක සභාවක් බවට පත් කරලා ඒ විෂයට අදාළ නිළධාරින් ගෙන්නවලා සාකච්ඡාවක් කරලා එහෙම කර ගන්න පුළුවන්. ඒ පිළිබඳව සභාවේ අදහස අරගෙන අපි ඉස්සරහට යමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා**

සභාපතිතුමනි, කාරක සභාවක් පත් කරනවට වැඩිය දැන් සභාවේ ගණ පූරණයත් තියෙනවනේ, ඒ නිසා අපි සභාවේ සාකච්ඡා කරගෙන යනකොට ඒගොල්ලෝ ගෙන්නන්න ඕනි නම් අවශ්‍ය වුණොත් ඒගොල්ලෝ ගෙනල්ලා සාකච්ඡා කරමු. එහෙම හොඳයි කියලා මට හිතෙනවා. කාරක සභාවක් විදියට පත් කරලා කතා කරන්න ගියොත් එක එක්කෙනා එක එක ඒවා කියයි. ඒක නිසා එහෙම හොඳයි නේද සභාපතිතුමා.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

මන්ත්‍රීතුමා කියන්නේ මේ මූල්‍ය ප්‍රකාශනය සම්මත කරලා පස්සේ මන්ත්‍රීවරුන්ට සහ මන්ත්‍රීවරියන්ට පුළුවන් මේක පරිශීලනය කරලා පස්සේ අදහස් ඉදිරිපත් කරන්න වගේ අදහසක් තමයි තියෙන්නේ. ඕනි නම් එහෙම කරන්න පුළුවන්. අපිට අදම මේක අවසන් කරගන්න පුළුවන් කාරක සභාවක් බවට පත් කරලා, සාකච්ඡා කරලා, වෙලාවක් අරගෙන මොකද අපිට මේවවරයි තියෙන්නේ ඒ නිසා කෙටි වෙලාවකින් අවසන් කර ගන්න පුළුවන්.ඒක නිසා කාරක සභාවක් බවට පත් කරලා සාකච්ඡාවක් කරලා, අදම මේක අවසන් කර ගන්න ඕනි. මොකද මේකට සභා අනුමැතිය අරගෙන හෙට අනිවාර්යයයෙන් විගණන කාර්යාලයට භාර දෙන්න ඕනි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා**

හරි සභාපතිතුමා එහෙනම් මම මේ ගරු සභාව කාරක සභාවක් බවට පත් කරන්න යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.සමන්කුමාර මැතිතුමා**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ❖ ඒ අනුව පෙ.ව.10.10ට මහා සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අනතුරුව ලේකම්තුමිය සහ විෂය නිළධාරි විසින් 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීමට අදාළ සමස්ත ක්‍රියාවලිය කාරක සභාව වෙත පැහැදිලි කිරීමෙන් අනතුරුව ලේකම්තුමිය විසින් මෙවර මූල්‍ය ප්‍රකාශය අලුත් ගිණුම්කරණ ප්‍රමිත මගින් නිර්දේශ කර ඇති ආකෘති මත පදනම්ව සකස් කොට ඇති බවද සඳහන් කරන ලදී.

අනතුරුව නව ගිණුම් ප්‍රමිතවලට අනුව මූල්‍ය ප්‍රකාශය සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව කාරක සභාව තීරණය කරන ලදී.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

හරි එහෙනම් දැන් මේ කාරක සභාව මහා සභාවක් බවට පත් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.බී.ගුණරත්න මැතිතුමා**

මේ කාරක සභාව මහා සභාව බවට පත් කිරීමට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා**

එම යෝජනවා මම ස්ථිර කරනවා.

- ❖ ඒ අනුව කාරක සභාව පෙ.ව.10.25ට නැවතත් මහා සභාව බවට පත් විය.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

හරි අපි එහෙනම් සභා අනුමැතිය ලබා දෙමු. මොකද මේක හෙට භාර දෙන්න තියෙනවා. අපි වෙන දවසක විෂය නිළධාරි ගෙනල්ලා හැමෝටම මේ ගැන අවබෝධයක් දෙමු.

- ඒ අනුව කාරක සභාවේදී තීරණය කර ගත් පරිදි 2025 වර්ෂයට අදාළ අවසාන ගිණුම් වාර්තාව සඳහා අනුමැතිය ලබා දීමට විශේෂ මහා සභාවේදී ඒකමතිකව තීරණය කරන ලදී.

ගමඇතිගේ ආරියදාස
සභාපති
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව